# රැවන් තාරකා

එදා කමතේ කොලඳින් කරද්දී ගම්මැද්දේ අපේ තරුණ ගැටව්, හිච්චි එකාලගේ එක් රාජකාරියක් වූයේ ගොන්පස් රාජකාරියයි. ඒ කියන්නේ කොළේ පාගන අම්බරුවන් එහෙම නැත්තම් මී හරකුන් පිටුපස ගොස් උන් හෙලන ගොම් පිඩ පිදුරු මිටකට ගෙන කමතින් ඉවත් කිරීමයි. එය ඔවුන් හට පුදුම විනොදයක් ඇති කළා. ඒ වගේම වාරි කන්ද උඩ එහෙම නැත්තම් ගොයම් පාගා කමතේ තැන් තැන් වල ගොඩ ගසා ඇති පිදුරු කඳු උඩ පිණුම් ගහන කොලුගැටයන් කොළඳින් අවසන් වූ කමත් වල එදා දක්නට ලැබුණු සුලභ දසුනක් වුනා. එදා මේ ජීවිත කෙත, කමත, ගොවිතැන හා තදින් බැඳී පැවතුණා. එහෙත් කාලය කෙමෙන් ගෙවී ගියා. මේ ගෙවී ගිය කාලයත් සමඟ බොහෝ දේ වෙනස් වුණා. අපේ කම හා බැඳුණු බොහෝ දේ එම ගෙවී ගිය කාලයත් සමග මිහිදන් වී තිබෙනවා. තරුණ ජීවිත කෙත කමතින් මෙන්ම ගොවිතැනින් ද ඈත්වෙමින් තිබුණා. වෙල් එළියේ නියරේ සරං කොටේ ගහගෙන දුව පැණ සෙල්ලම් කරපු කොලුගැටයටන් අද පෙනෙන්නට නැහැ. ඒ වෙනුවට ඇත්තේ ජංගම දුරකථනයත් මූණුපොතත් සමඟ හුදකලා වූ තරුණ පරම්පරාවකි. මෙම යුග පරිවර්තනය හරි හෝ වැරදි බව සාධාරණය කිරීමට සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් නොකරමු. මන්ද සියල්ල වෙනස්වන කල ඔවුනට පමණක් උඩුගම් බලා පිහිණීමට නොහැකියි. වෙනස්වන සියල්ල ඉදිරියේ උඩුගම් බලා පිහිණීමට තැත් නොකරන එහෙත් තවමත් ගොවිතැනත් අපේකමත් රැකගෙන පෙරමං යන තරු ගොන්නක් සොයා තමයි මෙවර ගොවිකම් සඟරාව පියමං කළේ. සැබවින්ම  එම තරු ගොන්න අපට හමුවුණා. සුන්දර ඇල්කඩුව කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ උඩංග මුව ග්‍රාමය කේන්ද්‍රකොට ගනිමින් එක් රොක් වී ඇති මෙම තරුණ ගොවි සමාජයට ''ශක්ති'' ලෙස නම් තබා ඇත්තේ ඕනෑම අභියෝගයක් ජයගැනීම සඳහා අවශ්‍ය ශක්තිය ලෙස ඔවුන් ක්‍රියා කරනු ලබන නිසාය. ඔවුන් කෘෂිකර්මාන්තයට උපන් හැකියාවක් දක්වයි. මීට වසර දහයකට පමණ ඉහතදී ආරම්භ කර ඇති මෙම තරුණ ගොවි සමාජය විවිධ කඩයිම් පසු කර වර්තමානයට පැමිණ තිබේ. ආරම්භයේදී විශාල සාමාජික සාමාජිකාවන් පිරිසක් මෙහි සිටි අතර ඔවුන් අද බොහෝ දෙනෙක් සමාජයේ ඉහළම තැන් වල රැඳී සිටී. ගෙවතු වගා ඇති කිරීම, කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘති ඇති කිරීම ආදී බොහෝ කෘෂිකාර්මික කටයුතු රාශියක මෙම තරුණ ගොවි සමාජය නිරතව ඇත. ඊට අමතරව විවිධ කෘෂිකාර්මික තරඟ සඳහා ඉදිරිපත්ව ජයග්‍රහණ රාශියක් ලබා ඇත. මෙම සමාජයේ බොහෝ දෙනකු තවමත් පාසල් වයසේ පසුවන ළමුන් වන අතර ඔවුන් මේ සියළු දේ කරන්නේ පාසල් වැඩ කටයුතුත් සමග වීම විශේෂත්වයකි. කෘෂිකාර්මික කටයුතු වලට අමතරව ප්‍රදේශයේ සුබසාධක කටයුතු ඉටුකරීමට උර දී ක්‍රියා කරනු ලබයි. සමාජීය, සංස්කෘතික, ක්‍රීඩා, ආගමික වශයෙන් විවිධ කටයුතු සංවිධානය කිරීමෙන් ප්‍රදේශ වාසීන් අතර අන්තර් සහයොගිතාව ශක්තිමත් කිරීමට මෙම තරුණ ගොවි සමාජයට හැකිවී ඇත. මෙම කර්තව්‍ය සියල්ලටම නිසි මගපෙන්වන්නේ මාතලේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ කාර්යාලයේ විෂයානුබද්ධ නිලධාරිනී කෘෂිකර්ම උපදේශිකා වයි. පී. ජයන්ති සිරිවර්ධන මහත්මිය හා මාතලේ නියෝජ්‍ය කෘෂිකර්ම උපදේශක කාර්යාලයේ විෂයානුබද්ධ නිළධාරි කෘෂිකර්ම උපදේශක ඩබ්.එම්. අබේරත්න බණ්ඩා මහතායි. ශක්ති ගොවි සමාජයේ වර්තමාන නියමුවා කෘෂි උපදේශක එම්. එම්. එස්. කේ. විජේසේන මහතායි. එලෙසම මෙම ප්‍රදේශයේ කෘෂි පර්යේෂණ හා නිශ්පාදන සහකාර යූ. ආර්. වසන්ති කුමාරි මහත්මියගෙන් ද මෙම තරුණ ගොවි සමාජයට ඉටුවන සේවය අගය කළ යුතුවේ. මෙවන් වූ මෙහෙවරක නිරතවන ශක්ති තරුණ ගොවි සමාජයේ ඉදිරි ගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවායි ගොවිකම් සඟරාවේ අපේ පැතුම වේ.



කෘෂිකර්ම උපදේශිකා :
වයි. පී. ජයන්ති සිරිවර්ධන



කෘෂිකර්ම උපදේශක :
ඩබ්. එම්. අබේසිංහ බණ්ඩා



කෘෂිකර්ම උපදේශක :
එම්. එම්. එස්. කේ. විජේසේන



අනුශාසක : පූජ්‍ය
ඇතුල්ගම විමලරතන හිමි



ගරු සාමාජික : ඩබ්. වී.
ආනන්ද සේනාරත්න



ගරු සාමාජික : පී. එච්. ඒ.
රමණි හේමලතා



ගරු සාමාජික : කේ. ඒ. එම්.
කේ. ප්‍රියංකා සේනාරත්න



ගරු සාමාජික :
ඒ. පී. කුසුමාවතී



ගරු සාමාජික : ආර්. එම්.
පී. ඩී. කේ. රණතුංග



ඩබ්. ආර්. ඉන්ද්‍රාණි තිලකරත්න



සභාපති : එම්. ඒ. ඉරේෂා
මධුමාධවී කුලතුංග



ලේකම් : ඩී. කේ. ඇල්කඩුව



භාණ්ඩාගාරික : ඩබ්. වී. පී.
ජයමිණි ප්‍රභාෂිනි සේනාරත්න



පී. එස්. පී. චතුනිකා විරාජිනි
අබේසේකර



උප භාණ්ඩාගාරික :
එම්. පී. ඩී. රණසිංහ



බී. එච්. පී. මධූෂා කුමුදුකුමාරි



ඩබ්. වී. පී. සජිත් කස්තූරි
සේනාරත්න



එම්. ඒ. දිනේෂ් කැලුම්
හරිස්චන්ද්‍ර



එම්. පී. දිනුවන් ප්‍රසාද්
කුලතුංග



කෘ.ප.නි.ස. :
යූ. ආර්. වසන්ති කුමාරි

තරුණ ගොවි සමාජ මූලස්ථානයේ මූලස්ථාන කෘෂිකර්ම උපදේශක
ආර්. ඒ. පී. කේ. රන්දෙණිය මහතාට ගොවිකම් සඟරාවේ අපි විශේෂ
ස්තූතිය පුදකර සිටිනවා